**ප්‍රසම්පාදන දැන්වීම**

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**<u>2022/23 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම</u>**

2022/23 වර්ෂය සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම වෙනුවෙන් 2022........... දින ප.ව. 2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. මේ සඳහා රු. ............ක ආපසු නොගෙවනු ලබන තැන්පත් මුදලක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවා ලබාගන්නා රිසිට්පතක් ගිණුම් අංශයට ඉදිරිපත් කිරීමෙන් පසුව ලංසු ලියකියවිලි 2022........... දින සිට 2022......... දින ප.ව. 3.00 දක්වා කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැක.

03. ලංසු ලියකියවිලි කාර්යාල වේලාවන් තුලදී නොමිලයේ පරීක්ෂා කළ හැකිය.

04. මුද්‍රාතබන ලද ලංසු ලියාපදිංචි තැපැලෙන් අංක 163, කිරුලපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 ලිපිනයට එවීම හෝ එම ලිපිනයේම ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීම 2022......... ප.ව. 2.00 ට පෙර සිදුකළ යුතුය. ලංසු විවෘත කිරීම 2022.......... දින ප.ව 2.00 ටසිදු කරනු ලැබේ.

05. මිල ගණන් බහාලන කවරයේ වම් කෙළවරේ **"කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාදීම සඳහා මිල ගණන්"** ලෙස සඳහන් කළ යුතුය.

මොහාන් සමරනායක
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

දුරකතන අංක :- 011 2512332/ 2514759
ෆැක්ස් අංක :- 011 2514286

DO NOT COPY

උපලේඛණ අංක 02

**<u>රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව</u>**
**<u>2022/23 වර්ෂය සඳහා කුලී පදනම මත ප්‍රවාහන සේවා ලබා ගැනීම</u>**
**<u>සඳහා මිල ගණන් කැඳවීම</u>**

01. මෙම කාර්යය ගිවිසුමට එළඹෙන දිනයේ සිට ලිත් වර්ෂයකට බල පැවැත්වේ. එහෙත් සේවාව අසතුටුදායක බව පෙනී ගියහොත් පූර්ව දැනුම්දීමකින් තොරව ඕනෑම අවස්ථාවකදී සේවාව අවසන් කිරීමට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත්තේය. එවැනි අවස්ථාවකදී සේවය අවසන් කිරීමට හේතු වූ කරුණු දැක්වීමට රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් බැඳී නොමැත.

02. ප්‍රවාහනය සඳහා යොදාගනු ලබන වාහන වෙනුවෙන් ගෙවීම් කරනුයේ කාර්ය නිමවූ පසුවය.

03. ප්‍රවාහන ඇණවුම නිකුත් කිරීමෙන් පසු නියමිත දින, නියමිත වේලාවට විනාඩි 30කට පෙර නියමිත ස්ථානයට පැමිණීම අනිවාර්ය වේ.

04. දිවා රාත්‍රී බේදයකින් තොරව දවසේ ඕනෑම අවස්ථාවකදී වාහන කැඳවීම සිදුවන අතර එම අවශ්‍යතාවන්ට අනුව වාහන සැපයීමට හැකියාව තිබිය යුතුය.

05. ප්‍රවාහන පහසුකම් සැපයීමේදී අදාල කාර්යයට අදාලව අධීක්ෂණ නිලධාරියෙකු සම්බන්ධ කෙරෙනු ඇත. ඒ අනුව ගමනට අදාල ධාවන සටහන් දුර ප්‍රමාණ අධීක්ෂණ නිලධාරියාගේ අත්සන සහිතව බිල්පත් / ඉන්වොයිස් ඉදිරිපත් කළ යුතුයි.

06. මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ආකෘතියෙහිම පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතු අතර එසේ නොමැතිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී පහත පරිදි කොටස් 02 කින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. සියළුම ගමන් සඳහා දුර ප්‍රමාණයන් සේවා සැපයුම්කරුගේ ආයතනයේ සිට නොව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සිට ආරම්භ විය යුතුයි.

- දිගු දුර ධාවනය ඇමුණුම 01
- කෙටි දුර ධාවනය ඇමුණුම 02

08. දැනටමත් මෙම ක්ෂේත්‍රයේ නියැලී සිටින බවටත් එම සේවා පහසුකම් ලබා දුන් රජය පිළිගත් ආයතන තුනකට ඔබ විසින් ලබාදුන් ප්‍රවාහන පහසුකම් පිළිබඳ වාර්තාවක් අදාළ ඇමුණුම් සමග ඉදිරිපත් කළ යුතුයි.

09. සේවා කටයුතු ලබාදීමේදී රජයේ කිසිදු දේපලකට හානියක් නොවිය යුතුය. එවැන්නක් සිදු වුවහොත් ඒවා යථාතත්වයට පත්කර දිය යුතුය. නියම කරන කාලය තුළම එම අළුත්වැඩියාවන් සිදුනොකළහොත්, ඒ සඳහා යන වියදම ආයතනයට ගෙවීමට ඇති මුදල් වලින් හෝ ඉදිරිපත් කරන ලද ඇප බැඳුම්කරයෙන් හෝ එම කාරණා දෙකෙන්ම අවස්ථානුකූලව අයකරගනු ඇත.

10. ටෙන්ඩරයෙන් නියම වන මිල හැර කිසිදු අමතර ගෙවීමක් සේවා සැපයුම්කරුට ගෙවනු නොලැබේ.

11. එසේම සේවා කටයුතු සඳහා යොදාගත් වාහන හා උපකරණ සම්බන්ධව සිදුවන ආපදා හා අලාභ සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව කිසිදු වගකීමක් නොදරන අතර එය අදාළ සැපයුම්කරු විසින් දැරිය යුතුය.

12. හදිසි අනතුරකදී, කාර්මික දෝෂයකින් හෝ වෙනත් හේතුවක් නිසා වෙන් කරදෙනු ලබන වාහනය ධාවනය කළ නොහැකි අවස්ථාවකදී ඒ බැව් දැනුම් දීමෙන් අනතුරුව දිග දුර ධාවනය සඳහා යොදාගනු ලබන වාහන සඳහා පැය 02 ක් ඇතුළතද, කෙටි දුර ධාවනය සඳහා පැය 01 ක් ඇතුළත ද වෙනත් සුදුසු වාහනයක් ලබා දිය යුතුය.

DO NOT COPY

13. ඒ ඒ රාජකාරි අවස්ථාවන්හිදී වෙන් කරනු ලබන වාහනය සඳහා යොදවනු ලබන අධීක්ෂණ නිලධාරියාගේ ඉල්ලීම පරිදි මාර්ග නීති රීතිවලට අනුකූලව වේග සීමා පවත්වාගත යුතුය. එසේම නිවැරදි ගමන් මාර්ගය සමග නිවැරදි ගමන්දුර සටහන් තැබිය යුතුය.

14. ප්‍රවාහන අවශ්‍යතාව වෙනුවෙන් සපයනු ලබන රථයේ ගමන් ගන්නා මගීන් හා ප්‍රවාහනය කරනු ලබන උපකරණ සඳහා සම්පූර්ණ රක්ෂණ ආවරණයක් තිබිය යුතු අතර හදිසි අනතුරකදී අදාළ වන්දි මුදල් ගෙවීමට අදාළ වාහන කුලී කරුවන් බැඳී සිටිය යුතුය. එසේම එම හදිසි අනතුරු සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වගකීමට කිසි ආකාරයකින් බැඳී නැත.

15. රාජකාරිය සඳහා සපයනු ලබන වාහනයෙහි රියදුරු හා/හෝ සහායක අදාල රාජකාරි සේවාවේදී විනයගරුකව හා කාර්යක්ෂමව හැසිරීම ප්‍රධාන වගකීම වේ.

16. අදාළ වාහනය සමග යොදවන රියදුරුට වලංගු රියදුරු බලපත්‍රයක් තිබීම අනිවාර්ය අතර රියදුරු මනා සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතුය.

17. රාජකාරි වගකීම් හා එකඟතා ප්‍රකාරව නියම කරනු ලබන තැන්පතු මුදලක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ රඳවා තැබීමට ඔබ ආයතනය එකඟවිය යුතුය.

18. මෙම ලංසුව පිළිබඳව හෝ සේවා ලබාගැනීම පිළිබඳව හෝ අවසන් තීරණ ගැනීමේ බලය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

19. මේ සම්බන්ධව ඇති සියලු කාරණාවන්හි අවසන් තීරණය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වරයා සතු වේ.

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

පූර්වෝක්ත කොන්දේසි වලට එකඟ වෙමු.

.........................................................
ලංසු කරුගේ අත්සන හා මුද්‍රාව

නම :- ......................................................................

තනතුර :- ......................................................................

දිනය :- ..................................................................

DO NOT COPY

උපලේඛණ අංක 3

**<u>2022/23 වර්ෂය සඳහා කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම</u>**

**<u>මිල ගණන් ඉදිරිපත් කිරීමේ ආකෘතිය</u>**

01. ලංසු කරුගේ නම :- ........................................................................................................................

02. ආයතනයේ නම :- ..........................................................................................................................

03. ව්‍යාපාර ලියාපදිංචි අංකය :- ..................................................................... (පිටපතක් අමුණන්න)

04. ආයතනයේ ලිපිනය :-

.........................................................................................................................................

.........................................................................................................................................

05. දු.ක. අංක - ආයතනය :- ................................................ ලංසුකරු :- .......................................

06. ෆැක්ස් අංකය :- ............................................

07. ඊමේල් ලිපිනය :- ..........................................................................

08. වැට් බදු සඳහා ලියාපදිංචි අංකය :- .....................................................

09. වෙනත් කරුණු :-

.........................................................................................................................................

.........................................................................................................................................

.........................................................................................................................................

...................................................................................................................

සටහන :- උපලේඛණ අංක 02 හි කොන්දේසි වලට එකඟව ඇමුණුම් අංක 01, 02, යටතේ ඉදිරිපත්කර ඇති මිලගණන් යටතේ සේවා සැපයීමට එකඟවෙමි.

...................................... ............................................

ලංසු කරුගේ අත්සන දිනය

.................................... ආයතනයේ මුද්‍රාව :-

නම

DO NOT COPY